**ආසාත්මිකතාවේද හා ප්‍රතිශක්තිවේද ආයතනය**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**කොන්ත්‍රාත් පදනම මත විද්‍යාගාර සහායක**

**සුදුසුකම්:**

අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ විද්‍යාගාර සහායක කාර්යයට අදාල තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 2 හෝ 3 මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථ දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පළපුරුද්ද.

**වෙනත්**

ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

තනතුරේ රාජකාරී හොඳින් ඉටු කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.

මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

වැටුප් පරිමාණය **:**

රු. 62,375/- (විශ්ව විද්‍යාලයීය පාලක සභා තීරණය ප්‍රකාරව)

අයදුම්කරුවන් තම ඉපයීම් වලින් 10%ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම් වලින් 15%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලට හා 8%කට සමාන මුදලක් විශ්වවිද්‍යාලයීය විශ්‍රාම වැටුප් අරමුදලට බැර කරනු ලැබේ. එයට අමතරව 3%ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට බැර කරනු ලැබේ.

බඳවා ගැනීම

වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස

වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**අයදුම් කිරීම**

අයදුම්පත් **www.iai.ac.lk/vacancies** යන වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැකි අතර අයදුම්පත් **recruitments.iai@sjp.ac.lk** යන ඊමේල් ලිපිනයට පමණක් අදාළ සියළුම සහතිකපත් සමඟ **2026 ඔක්තෝම්බර් මස 06** දින හෝ එදිනට පෙර ලැබීමට සැලැස්විය යුතු වේ.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනයක / රාජ්‍ය දෙපාර්තමේන්තුවක / රාජ්‍ය සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය කරන අයදුම්කරුවන් අයදුම් කරන ලද තනතුරට තේරී පත්වුවහොත් තමා සේවය කරන ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවට වූ තම ආයතනයේ ප්‍රධානී සහතිකය අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ එවිය යුතුය.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම හෝ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතික වල ඡායා පිටපත් අමුණා නොතිබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. යම් තනතුරක් සඳහා අයදුම්පත් විශාල සංඛ්‍යාවක් ලැබුණු අවස්ථාවක අවස්ථාවෝචිත ක්‍රමයක් අනුගමනය කරමින් අයදුම්කරුවන් සීමා කිරීමක් සිදු වේ.

අයදුම්පත මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීමට පෙර තොරතුරුවල නිවැරදි බව තහවුරු කරගත යුතු වේ. සාවද්‍ය තොරතුරු හෝ අසම්පූර්ණ තොරතුරු සහිත අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.

කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බැලීම සිදු නොකෙරේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි
ආසාත්මිකතාවේද හා ප්‍රතිශක්තිවේද ආයතනය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.
16.09.2026.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED